(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 119.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 සැප්තැම්බර් මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0040/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා රජයට ණය මුදල් ලබා දී ඇති රටවල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ බැංකු සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට ගෙවීමට ඉතිරිව තිබෙන ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1999 වර්ෂය අවසාන වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී රටවල් හෝ ආයතන විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(v) ණය පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාල පරිච්ඡේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ලබාගෙන ඇති ණය මුදල්ද සමග වර්ෂ 2000 සිට 2015 දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සම්පූර්ණ ණය ක්‍රමක්ෂය (මුල් ණය මුදල සහ පොලී ගෙවීම්) කොපමණද;

(ii) ඉහත දක්වා ඇති දත්ත ඇමරිකානු ඩොලර්වලින් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1113/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ මහ නගර බල ප්‍රදේශය තුළ නවතා තබනු ලබන රථවාහනවලින් ගාස්තුවක් අයකරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ නගර සභා සීමාව තුළ නවතා තබනු ලබන වාහනවලින් ගාස්තු අයකරන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් ස්ථානයකට යොදවා ඇති රථ වාහන පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත ස්ථාන අතරින් මරදාන පොලීසිය ඉදිරිපිට සේවයේ යොදවා ඇති රථවාහන පාලිකාවන්ට අමතරව වෙනත් අයද හදිසියේ පැමිණ එහි නවතා තබා ඇති රථවාහනවලින් ගාස්තු අයකරන බවත්;

(ii) මෙම ස්ථානයේ ස්ථිර සේවයට යොදවන ලද එච්. ඩී. අශෝකා මහත්මිය ඉහත තත්ත්වය පිළිබඳව බලධාරීන්ගෙන් විමසා සිටීම හේතුවෙන් මේ වන විට ඇය වෙනත් ස්ථානයකට මාරු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) අශෝකා මහත්මිය එසේ මාරු කිරීමට හේතු කවරේද;

(ii) එම ස්ථාන මාරුව අවලංගුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1141/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ජනවාරි මාසයේදී නැගෙනහිර පළාතේ ඇති වූ ජල ගැලීම්වලින් පීඩාවට පත්වූවන් සඳහා සහන සැලසීමට රජය විසින් වෙන් කළ මුදල කොපමණ ද;

(ii) ඒ යටතේ එක් පවුල් ඒකකයකට ලැබෙන මූල්‍යාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ ගංවතුරින් පීඩාවට පත් වූවන් සඳහා සහන සැලසීමේ අපේක්ෂාවෙන් රජයේ සේවකයින්ගේ දිනක වැටුප ලබා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එමගින් රජය උපයා ගැනීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගංවතුර නිසා අවතැන් වූ ජනතාව වෙනුවෙන් රජය ප්‍රතිපාදන වෙන් කර තිබියදීත් රජයේ සේවකයින්ගේ දිනක වැටුප ඒ සඳහා ලබා ගැනීම සාධාරණ නොවන බවත්;

(ii) ගංවතුරෙන් අවතැන් ජනතාව අතර රජයේ සේවකයින් ද සැලකිය යුතු පිරිසක් ඇතුළත් හෙයින් ඔවුන්ගේම මුදල් කප්පාදු කර ඔවුන් වෙතම ලබා දීම සාර්ථක වැඩපිළිවෙළක් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා දකුණු කොරියාව වෙත යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දකුණු කොරියාවේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය මගින් ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1253/'11

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1564/'11

6.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කයන්හි, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් යටතේ ඇති රජයේ නිල නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පදිංචිය සඳහා එකී නිවාස ලබාගැනීමට හිමිකම් ඇති අය කවුරුන්ද;

(iii) නිවාස ලබා ගැනීමට හිමිකම් ඇති අය සඳහා එම නිවාස වෙන්කිරීම අනුමත කරනු ලබන බලධාරියා කවුරුන්ද;

(iv) එම නිවාස සඳහා මාසික කුලී අයකිරීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1070/'11

7.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී,

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සමත් වූ ප්‍රතිශතය කොපමණද;

(iii) ගණිතය, සිංහල, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් සමත් වූ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රජයේ පාසල්වල ලබාදෙන අධ්‍යාපනයේ ප්‍රමිතිය පහත වැටීමක් සිදු වී තිබීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ පහ සඳහා අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කළ සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1114/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීමට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා 2007 වර්ෂයේදී පැවති තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව වර්ෂ 2010 ජූලි මස පැවති සම්මුඛ පරීක්ෂණයේදී එම විභාගයෙන් ලබා ගත් ලකුණුවලට අමතරව අපේක්ෂකයින් සඳහා ලකුණු ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2007 වර්ෂයේදී පවත්වන ලද තරඟ විභාගයේදී වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් නොසලකා හැර අඩු ලකුණු ලැබූ අයදුම්කරුවන්ට මේ වනවිට පත්වීම් ලබා දී තිබේද;

(ii) එලෙස අඩු ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ට පත්වීම් ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෙරවලපිටිය දක්වා දැවි තෙල් පරිවහනය කිරීමට මුහුද හරහා නල මාර්ගයක් ඉදි කර තිබේද;

(ii) එසේ නම්, එම නල මාර්ගයේ ආරම්භක ස්ථානය, අවසන් ස්ථානය සහ මුළු දුර ප්‍රමාණය කවරේද;

(iii) එය ඉදිකිරීම සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) එම අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(v) එම නල මාර්ගය ඉදිකිරීමට අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

(vi) මේ වන විට එම නල මාර්ගය අදාළ කටයුත්ත සඳහා භාවිතා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1254/'11

10.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1423/'11

11\.
ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 සිට 2011 දක්වා එක් එක් වර්ෂයේදී සංචාරක මණ්ඩලයට පවරා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ඉඩම් මේ වන විට ලබා දී ඇති ව්‍යාපෘති කවරේද;

(iii) එම ඉඩම් සඳහා ලැබී ඇති මුදල කොපමණද;

(iv) ඉහත එක් එක් ව්‍යාපෘතියට අදාළ පුද්ගලයින්, සමාගම් හෝ ආයතන කවරේද;

(v) එම පුද්ගලයන්ට, සමාගම්වලට හෝ ආයතනවලට ඉඩම් ලබාදී ඇති පදනම කවරේද;

(vi) එම ඉඩම්වල මේ වන විට අදාළ ව්‍යාපෘති ආරම්භ කර තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1072/'11

12\.
ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකික හෙද හෙදියන් 25,000ක් මෙරට සේවයේ සිටියදී විදේශ හෙද හෙදියන්ට ශ්‍රී ලංකාව තුළ සේවය කිරීමට ඉඩ සලසා තිබීමට හේතු කවරේද;

(ii) සිය අවශ්‍යතාවයන් සඳහා හෙද හෙදියන් පුහුණු කිරීමට පෞද්ගලික රෝහල්වලට හැකියාව තිබේද;

(iii) රජය හෙද හෙදියන් රක්ෂණය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1115/'11

13\.
ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම සඳහා ගුරු උපදේශකවරු විශාල සේවාවක් ඉටු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ගුරු උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) ඔවුන්ට හිමි වරප්‍රසාද සහ දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවා තෘප්තිමත්භාවය ඇතිකර ගුරු උපදේශකයින්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා ගුරු උපදේශක සේවාවක් ඇති කිරීමටත්;

(ii) ඒ තුළින් ඔවුන්ගේ සේවාවේ සුරක්ෂිතතාවය ඇති කිරීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1143/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතක දී ඇති වූ පොල් හිඟය මගහැරවීම සඳහා තාවකාලික පිළියමක් ලෙස පොල් ආනයනය කිරීමට රජය ගත් තීරණයට අනුව පොල් ආනයනය කළ රටවල් කවරේද;

(ii) ඒ යටතේ මේ වන විට ආනයනය කර ඇති පොල් ගෙඩි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කේරලයෙන් මෙරටට ආනයනය කරන ලද පොල් ගෙඩි තොගයක් විනාශ කර හෝ විනාශ කිරීමට තීරණය කර හෝ තිබේද;

(ii) එසේ නම්, එම පොල්ගෙඩි සංඛ්‍යාව කොපමණද;

(iii) ආනයනය කළ පොල් එසේ විනාශ කිරීමට තීරණය කිරීමට හේතු වූ කරුණු කවරේද;

(iv) එම පොල් තොගය ආනයනය කිරීමට වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1255/'11

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*3.

පරිසර අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 (2) (ඍ) වැනි වගන්තිය යටතේ පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2009 නොවැම්බර් 10 දිනැති අංක 1627/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 ජූනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 4),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 5),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 6),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*11.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*12.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*13.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද,

2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*21.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*22.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

25.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

26.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0668/'10

1.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආනයනය කළ සහල්, පිටි, සීනි, පළතුරු, කුළු බඩු ඇතුළු සියලු ආහාර ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන්;

(ii) එම ද්‍රව්‍ය ආනයනය කළ රටවල්;

(iii) මෙරටට ගෙන්වන ලද ආයතන හා පුද්ගලයින්;

(iv) රටට ගොඩබාන විට එක් එක් ආහාර වර්ගයේ වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0858/'10

2.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම, ඌව, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු පළාත් සභාවන් තුළ මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් පාසල්හි සේවය කරන ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද යන්න එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ පළාත් මට්ටමින් ගුරුවරුන්ට ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම හිඟ වැටුප් ගෙවීමට රජය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ වෙන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/'11

3.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මඟින් සයිප්‍රසයට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සයිප්‍රසයේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මඟින් ලිබියාවට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලිබියාවේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට්පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1148/'11

5.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මඟින් ජපානයට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජපානයේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට්පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?